# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2469/05 - 2025 දෙසැම්බර් මස 29 වැනි සඳුදා - 2025.12.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66ආ (2) වගන්තිය යටතේ ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාවේ උප සභාපති ධුරයේ පුරප්පාඩුව පිරවීම**

උප සභාපති, සභාපති ධුරයට පත්වීම හේතු කොට ගෙන ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාවේ උප සභාපති ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66ආ (2) වන වගන්තිය යටතේ තනතුර දැරූ උප සභාපති වන රණසිංහගේ කේනමන් දිසානායක අයත් වන්නා වූ ජාතික ජන බලවේගය නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත උප සභාපති වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාවේ උප සභාපති පිළිබඳව තීරණය කිරීමට, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා කපුරු බංඩාගේ කරුනාරත්න නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි සෙල්ලදොරේ කලියුගනාදන් දේව නෙරංජන් වන මම, 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය වූ) 66ආ (2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, කපුරු බංඩාගේ කරුනාරත්න, ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාවේ උප සභාපති වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**එස්. කේ. දේව නෙරංජන්,**
තේරීම්භාර නිලධාරි,
ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාව.

2025 දෙසැම්බර් මස 29 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
ත්‍රිකුණාමලය.

EOG 12 - 0256


1A - PG 7438 — 09 (2025/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*